සැ. යු.- 2021.06.18 දින පළ වූ අංක 2233 දරන ගැසට් පත්‍රයෙහි I:III, II, III, IV(අ) සහ IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,234 - 2021 ජුනි මස 25 වැනි සිකුරාදා - 2021.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 932 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජූලි මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## ගම්පහ මහා නගර සභාව

### 2021 වර්ෂයට ඉඩම් විකිණීම විෂයෙහි බදු පැනවීම

මහා නගර සභා ආඥාපනතේ 247අ (10) වගන්තිය යටතේ ගම්පහ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2020 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද ගම්පහ මහා නගර සභා රැස්වීමේ අංක 261 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. ඩී. ජී. එස්. රණසිංහ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව ගම්පහ.

2020 දෙසැම්බර් මස වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**247 ඉ 1 වගන්තිය**

මහා නගර සභාවක පාලන සීමාව තුල පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් ඒ ඉඩම විකුණාලත් මුදලින් ඒ සභාවට ගෙවිය යුතුය.

06-381/2

---

## ගම්පහ මහා නගර සභාව

### විනෝද බද්ද - 2021 වර්ෂය

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත (176 අධිකාරිය) 3 වැනි වගන්තිය යටතේ සෑම චිත්‍රපටි දර්ශනයක්, සැණකෙළියක්, මුදල් අය කරනු ලබන සෑම දර්ශනයක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට විසිපහක (25%) විනෝද බද්දක් විකුණුම් දෛනික වාර්ථා ඉදිරිපත් කර ගෙවිය යුතු බවටත්,

1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2(1) වගන්තියේ හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ විනෝද බදු අය කිරීම සඳහා සෑම ප්‍රදර්ශන ක්‍රීඩා තරගයක්, සැණකෙළියක් හෝ වෙනත් විනෝද ක්‍රීඩා, විනෝදාංශ ඉසව් හා විනෝද සංදර්ශන සඳහා ප්‍රවේශ පත්‍රවල මුද්‍රිත වටිනාකමින් උපරිම සියයට විසිපහක (25%)ක විනෝද බද්දක් ගෙවිය යුතු බවටත්,

සංගීත සංදර්ශනයක් පැවැත්වීම වෙනුවෙන් නිකුත් කරනු ලබන ඇතුළත්වීමේ ප්‍රවේශපත්‍රවල මුද්‍රිත මුහුණත වටිනාකමින් සියයට විසිපහක (25%)ක විනෝද බද්දක් ද ගෙවිය යුතු බවටත්,

2020.10.29 දින 261 අංක දරන තීරණය මගින් තීරණය කර ඇත.

එබැවින්, අදාළ බදු මුදල් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලබන අතර, ඒ වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයේ පරිදි බලපත්‍ර ගාස්තුවක් ද ගෙවිය යුතුය.

02. විනෝද සංදර්ශන හා පොදු විනෝදාත්මක ඉසව් හා ක්‍රියා අයිතම් සඳහා ඇතුල්වීමේ දී අලෙවි කරනු ලබන ප්‍රවේශපත්‍රවල මුද්‍රිත වටිනාකමින් උපරිම සියයට විසි පහක (25%)ක විනෝද බද්දක් අය කිරීම.

03. ඊට අමතරව පහත උපලේඛනයේ පරිදි ගාස්තු ගෙවා පොදු රැඟුම් බලපත්‍රයක් ලබා ගැනීම.

ජේ. ඒ. ඩී. ජී. එස්. රණසිංහ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව ගම්පහ.

2020 දෙසැම්බර් මස වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *දින ගණන* | *අයකරන බලපත්‍ර මුදල* |
|---|---|
| එක් දිනක වැඩසටහනක් සඳහා | රු. 1,000 + රජයේ අනුමත බදු මුදල් |
| දිනකට වැඩි දින 03ක් දක්වා වැඩසටහනක් සඳහා | රු. 2,000 + රජයේ අනුමත බදු මුදල් |
| දින 03ට වැඩි සහ දින 07ක් දක්වා වැඩසටහනක් සඳහා | රු. 3,000 + රජයේ අනුමත බදු මුදල් |
| දින 07ට වැඩිවන සෑම වැඩසටහනක් සඳහා | රු. 5,000 + රජයේ අනුමත බදු මුදල් |

06-381/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.